# සුරකිමු ලංකා

සැතපුම් දහස් ගණනක් එපිට ශ්‍රී ලංකාවේ ඉපිද වසර ගණනාවක් ජීවත් වූ අප වරින් වර ශ්‍රී ලංකා භූමියට පය තබද්දී ලබන්නේ අපරිමිත ආශ්වාදයකි. කිඹුල්වතෙන් එන සුළඟ ද මට සැපකැයි වරෙක බුදුන් වහන්සේ දෙසුවාක් මෙන් සිරිලකෙන් එන සුළඟද අපට සැපතකි. අප ජීවත් වන ඕස්ට්‍රේලියාව මෙන්ම ශ්‍රී ලංකාව ද අප රැක ගත යුතු වීමට එයද එක් කරුණකි.

අන්තවාදී ආගමික කල්ලි විසින් රට වැසියා හා රටේ ආර්ථිකය දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කරමින් සිටින මෙවන් අවස්ථාවක ඊට එරෙහි වීම අපගේ පරම යුතුකම ලෙස සලකා සුරකිමු ලංකා මෙල්බර්න් එකමුතුව හා තවත් සංවිධාන වල සහභාගීත්වයෙන් 2019 මැයි මස 12 වැනි දින මෙල්බර්න් නුවර ෆෙඩරේෂන් චතුරස්‍රයේ දී සාමකාමී දැවැන්ත උද්ඝෝෂණයක් පැවැත්විණි.

මෙවැනි අන්තවාදී කටයුතු වලට ශ්‍රී ලංකාව තුළ වැඩෙන්නට ඉඩ නොතබන ලෙසටත් ඊට සම්බන්ධ අය තරාතිරම නොබලා අත් අඩංගුවට ගෙන නීතිය හමුවට පමුණුවන ලෙසටත් රටේ වර්තමාන තත්වය දඩමීමා කරගෙන විදේශ බලවේග රටට අත පෙවීම වලක්වන ලෙසටත් ශ්‍රී ලංකා රජයට වන වගකිව යුත්තන්ට අවධාරණය කිරීම මෙහි අරමුණ විය.

අපගේ ජන්ම භූමිය පණ සේ රැක ගනිමු. සහභාගී වූ සියළු දෙනාට සුරකිමු ලංකා එකමුතුවේ ගෞරවනීය ප්‍රණාමය.

අරුණ රෝහණදීප










